ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

**පුවත්පත් නිවේදනය**

**ඉන්දියාවේ 77 වන ජනරජ දිනය සැමරේ**

කොළඹ, ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය විසින් 2026 ජනවාරි 26 වන දින ඉන්දියාවේ 77 වන ජනරජ දිනය කොළඹ දී සමරන ලදි. ලොව දීර්ඝතම ලිඛිත ව්‍යවස්ථාව වන ඉන්දීය ව්‍යවස්ථාව බලාත්මක කෙරුණේ 1950 ජනවාරි 26 වන දිනයේදීය. ඉන්දීය ව්‍යවස්ථාවේ පූර්විකාව අනුව ඉන්දියාව සෛවරී, සමාජවාදී, ලෞකික, ප්‍රජාතාන්ත්‍රික ජනරජයක් වේ.

2. ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මැතිතුමා සිය නිල නිවස වන ඉන්දියා හවුස් හිදී ඉන්දීය ජාතික ධජය එසවීය. ඉන් අනතුරුව එතුමා හමුදා උත්තමාචාර නිරීක්ෂණය කළේය. ඉන්දීය ජනාධිපතිනියගේ ජනරජ දින කතාවෙන් උපුටා ගන්නා ලද කොටස් ද මහ කොමසාරිස්තුමා විසින් ඉදිරිපත් කරන ලදී.

3. ශ්‍රී ලංකා නාවික හමුදා වාද්‍ය වෘන්දය විසින් ඉදිරිපත් කරන ලද දේශාභිමානී ගීතයන්ගෙන් සහ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේ සංස්කෘතික අංශය වන ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය විසින් ඉන්දියාවේ පොහොසත් විවිත්‍රත්වය සමරමින් ඉදිරිපත් කරන ලද නර්තන සහ සංගීත අංගයන්ගෙන් සමන්විත සංස්කෘතික වැඩසටහනකින් ද ජනරජ දින සැමරුම අලංකාරවත් විය. මෙම වසරේදී ඉන්දියාවේ ජාතිය හා බද්ධ වූ ගීතය වන වන්දේ මාතරම් ගීතයේ 150 වන සංවත්සරය සැමරීම සුවිශේෂී සන්ධිස්ථානයකි. 1875 වසරේදී බංකිම් චන්ද්‍ර චැටර්ජි විසින් රචිත පසුව ඔහුගේ ආනන්දමත් නවකතාවට ඇතුළත් කරන ලද වන්දේ මාතරම් ගීතයේ අදහස වන්නේ, “මැණියනි, මම ඔබට නමස්කාර කරමි” යන්නයි. මෙම සදාකාලික ගීතය මාතෘ භූමියට හෘදයාංගම උත්තමාචාරයක් වේ. වැඩසටහනට ඇතුළත් වූ ඉදිරිපත් කිරීම් තුළින් එහි තනුව පමණක් නොව එය තුළින් ලබා දෙන ආදරයේ, ගෞරවයේ සහ එකමුතුභාවයේ පණිවිඩය පිළිබිඹු කරමින් මෙම ගීතයට උපහාර පුද කරන ලදී.

4. එසේම, අද උදෑසන මහ කොමසාරිස්තුමා සහ මහ කොමසාරිස් කාර්යාලයේ නිලධාරීහු ඉන්දීය සාම සාධක හමුදා ස්මාරකය අභියස දී ඉන්දීය සාම සාධක හමුදා විරුවන්ට ද උපහාර පුද කළහ. ජනරජ දිනය නිමිත්තෙන්, “Timeless Bollywood Melodies: Anuradha Paudwal Live in Sri Lanka” නමින් ප්‍රසංගයක් ද ඉන්දියාව සහ ශ්‍රී

ලංකාව අතර දිගුකාලීන සංස්කෘතික බැඳීම් සමරමින් 2026 ජනවාරි 23 වන දින සංවිධානය කර තිබිණ. එසේම, ඉන්දීය වෙරළාරක්ෂක බලකායේ වරහා සහ අතුල්‍යා නෞකා ශ්‍රී ලංකාවට පැමිණ තිබෙන අතර එම නෞකා 2026 ජනවාරි 24-27 දිනවල සිය සංචාරය අතරතුර කොළඹ සහ ගාල්ලේ සංචාරය කරනු ඇත.

5. 77 වන ජනරජ දිනය නිමිත්තෙන් සංවිධානය කරන ලද ප්‍රිය සම්භාෂණයක් අද සන්ධ්‍යාවේ ඉන්දියා හවුස් හිදි පැවැත්වෙනු ඇත. සෑම ක්ෂේත්‍රයකම සම්භාවනීය අමුත්තන් රැසක් මෙම උත්සවයට සහභාගී වීමට නියමිතය.

6. හම්බන්තොට සහ යාපනය ඉන්දීය කොන්සියුලර් ජෙනරාල් කාර්යාල සහ මහනුවර සහකාර මහ කොමසාරිස් කාර්යාලය විසින් ද 77 වන ජනරජ දිනය සැමරීම සඳහා විශේෂ වැඩසටහන් සංවිධානය කර තිබේ.

***

**කොළඹ**
***2026*** *ජනවාරි* ***26***